# කෘෂිකර්මාන්ත අංශයේ සේවා නියුක්තිය






මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව

පි.ඩබ්.චතුරිකා චන්ද්‍රසේන

## 01.සංක්ෂේපය

කෘෂිකාර්මික අංශය යනු සෑම රටකම ආර්ථිකයේ ප්‍රධාන අංගයකි.වර්තමානය වන විටත් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සුවිශේෂී කාර්ය භාරයක් කෘෂි අංශය සතුව පවතී.නිදහසින් පසු සමස්තයක් ලෙස ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂි අංශයේ දායකත්වය ක්‍රමයෙන් පහළ යාමක් පෙන්වයි.කාර්මික හා සේවා අංශයන්ට සාපේක්ෂව කෘෂි අංශයේ සාපේක්ෂ පහළ යාමක් දක්නට ලැබුනත් නිරපේක්ෂව තවමත් කෘෂි නිමවුම ඉහළ මට්ටමක පවතී.අනෙක් අතට ග්‍රාමීය දිළිඳු ප්‍රජාවට සේවා නියුක්ති අවස්ථා සැපයීමෙහිලා සුවිශේෂ කාර්ය භාරයක් කෘෂි අංශය මගින් ඉටු කරනු ලබයි.එසේම විදේශ වෙළඳාම තුළ කාර්මික නිෂ්පාදිතයන් සඳහා වැදගත් තැනක් හිමි වුවද ශුද්ධ අපනයන ඉපයුම් වර්ධනය කිරිමටත් ඒ හරහා ආර්ථික ගැටළු ගණනාවක් අවම කර ගැනිමටත් කෘෂි අංශය හේතු වේ.මේ අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකාර්මික අංශය මඟින් දක්වන දායකත්වය ඒ සඳහා ඇති සේවා නියුක්තියද පෙන්නුම් කෙරේ.

## 02.හැදින්විම

ලෝකයේ සෑම රටකම ආර්ථිකයේ ගාමක බලවේගය වන්නේ කෘෂිකර්මාන්තයයි.කෘෂිකර්මාන්තය කාර්මික හා අනෙකුත් සේවා අංශයන්ට අවශ්‍ය කරන පදනම සකස් කර දෙන්නා සේම පරිසර හිතකාමී චිරස්ථායි සංවර්ධනයක් ඇති කිරිමෙහිලා ඉතා වැදගත් කොට සැලකේ.සෑම රටකම සංවර්ධන ක්‍රියාවලියේදී කෘෂි අංශයට ඉතා වැදගත් තැනක් හිමි වේ.වර්තමාන ලෝකයේ මුල් පෙළේ ආර්ථික,කාර්මික,හා තාක්ෂණික බලවතුන් බවට පත් වී සිටින ඇමරිකාව ,ජපානය වැනි රටවල වර්තමාන අභිවෘද්ධිය පසුපස ඇත්තේ සැලසුම් සහගත කෘෂිකාර්මික සංවර්ධනයයි.විශේෂයෙන්ම කෘෂිකාර්මික ප්‍රතිපත්තිය කෙරෙහි දැක්වූ සුවිශේෂී අවධානයත් ,මුලික වශයෙන් රැකියා හා ජාතික ආදායම් ඉහළ නැංවිමේ ප්‍රධාන මුලාශ්‍රය බවට කෘෂිකර්මාන්තය පත් කිරිමත් මෙහිදි ඉතා වැදගත් වේ.නමුත් වර්තමානය වන විට සාපේක්ෂව දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂි අංශයේ දායකත්වය ක්‍රමයෙන් හීන වෙමින් පවතී.එසේ වුවත් ආසියානු,අප්‍රිකානු හා ලතින් ඇමරිකානු රටවල් ප්‍රමුඛ සංවර්ධනය වෙමින් පවතින රටවල් කේන්ද්‍ර කොට ගනිමින් වර්ධනය වන ජනගහනයට අවශ්‍යය ආහාර හා අනෙකුත් අවශ්‍යතා සපුරාලිමෙහිලා කෘෂිකාර්මික අංශය පුළුල් කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.එය ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වන රටවල් තුළ මෙන්ම අනෙකුත් සංවර්ධිත රටවල් තුළද ප්‍රායෝගිකව දක්නට ලැබෙන්නකි.

ශ්‍රී ලංකාව සලකා බැලු විට එය වසර 2500 කට වඩා වැඩි ඓතිහාසික උරුමයක් පවතින ස්වාභාවයෙන්ම කෘෂිකාර්මික රටකි.ගොවිතැන,ස්වයං පෝෂිත බව පිළිබඳ සලකා බැලිමේදී පෙරදිග ධාන්‍යාගාරය ලෙස හැදින්විමට තරම් අභිමානවත් කෘෂිකාර්මික ඉතිහාසයක් ලංකාව තුළ පැවතුණි.දිර්ඝ කාලයක් තිස්සේ ලංකාව තුළ පැවතියේ සාම්ප්‍රදායික යැපුම් කෘෂිකාර්මික රටාවකී.එම සාම්ප්‍රදායික කෘෂිකාර්මික රටාව වෙනසකට ලක්වන්නේ යුරෝපා ජාතින්ගේ ආගමනයත් සමඟයි.විශේෂයෙන්ම යුරෝපීය ජාතිකයින්ගේ පැමිණිමෙන් පසු මෙරටට හඳුන්වා දෙන ලද වතු වැවිලි වගාව ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වෙනස්කම් ගණනාවක් ඇති කිරිමට හේතු විය.සාම්ප්‍රදායිකව මෙරට පැවති වී වගාව හා අනෙකුත් අතුරු භෝග වගාවන්ට අමතරව තේ රබර් පොල් වැනි වතු වැවිලි වගාවන්ද සුළු අපනයන භෝග වගාවන්ද කෘෂි අංශය යටතේ ව්‍යාප්ත කරන ලද අතර එය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා ඉතා වැදගත් විය.

2006 වන විට ලෝකයේ කම්කරුවන්ගෙන් 36% කෘෂිකර්මාන්තයේ නියැලි ඇති බව ඇස්තමේන්තු කර තිබුණි.කාර්මිකරණය ඇරඹිමත් සමඟ කෘෂිකර්මාන්තයෙහි වැදගත්කම අඩු විය.2006 වර්ෂය වන විට ආර්ථික අංශය ලෝක ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් සේවයට ගැනිම නිසා ඉතිහාසයේ ප්‍රථම වතාවට සේවා අංශය

කෘෂිකර්මය අභිබවා ගියේය.ලෝක ජනගහනයෙන් තුනෙන් එකක් කෘෂිකර්මාන්ත අංශයෙහි සේවය කළා වුවද ලෝක දළ නිෂ්පාදනයේ කෘෂි නිෂ්පාදන වලට ඇත්තේ 5%ට අඩු ප්‍රතිශතයකි.( ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා)

මේ වන විට කෘෂිකර්මාන්තයේ ඇති ප්‍රධානම ගැටළුව වන්නේ සේවා නියුක්තියේ අඩු දායකත්වයක් කෘෂිකර්මාන්තයට ලැබීමයි. 2013 වර්ෂයේ 2,321,000 ක් වූ කෘෂිකාර්මික සේවා නියුක්තිය 2016 වසර වන විට 2,154,000 දක්වා අඩු වී ඇත.කෘෂිකර්මාන්තය යනු මිනිසාගේ පැවැත්මට අත්‍යාවශ්‍ය ක්ෂේත්‍රයක් බව අවබෝධ කර ගත යුතු අතර නව තාක්ෂණය සමඟ මුසු වූ නූතන කෘෂිකර්මාන්තයේ නියමුවානන් සමාජයේ වැදගත් යැයි සම්මත රැකියාවල නියැලෙන්නන්ට සමානවම තත්ත්වයෙන් උසස් රැකියාවක් බව සමස්ථ සමාජයම හඳුනා ගත යුතු අතර එමගින් රටේ අනාගතය සුරක්ෂිත කර ගත හැක.

2006 වන විට ලෝකයේ කම්කරුවන්ගෙන් 36% කෘෂිකර්මාන්තයේ නියැලී ඇති බව ඇස්තමේන්තු කර තිබුණි.කාර්මීකරණය ඇරඹීමත් සමඟ කෘෂිකර්මාන්තයෙහි වැදගත්කම අඩු විය.2006 වර්ෂය වන විට ආර්ථික අංශය ලෝක ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් සේවයට ගැනීම නිසා ඉතිහාසයේ ප්‍රථම වතාවට සේවා අංශය කෘෂිකර්මය අභිබවා ගියේය.ලෝක ජනගහනයෙන් තුනෙන් එකක් කෘෂිකර්මාන්ත අංශයෙහි සේවය කළා වුවද ලෝක දළ නිෂ්පාදනයේ කෘෂි නිෂ්පාදන වලට ඇත්තේ 5%ට අඩු ප්‍රතිශතයකි.

මේ වන විට කෘෂිකර්මාන්තයේ ඇති ප්‍රධානම ගැටළුව වන්නේ සේවා නියුක්තියේ අඩු දායකත්වයක් කෘෂිකර්මාන්තයට ලැබීමයි. 2013 වර්ෂයේ 2,321,000 වූ කෘෂිකාර්මික සේවා නියුක්තිය 2016 වසර වන විට 2,154,000 දක්වා අඩු වී ඇත.කෘෂිකර්මාන්තය යනු මිනිසාගේ පැවැත්මට අත්‍යාවශ්‍ය ක්ෂේත්‍රයක් බව අවබෝධ කර ගත යුතු අතර නව තාක්ෂණය සමඟ මුසු වූ නූතන කෘෂිකර්මාන්තයේ නියමුවානන් සමාජයේ වැදගත් යැයි සම්මත රැකියාවල නියැලෙන්නන්ට සමානවම තත්ත්වයෙන් උසස් රැකියාවක් බව සමස්ථ සමාජයම හඳුනා ගත යුතු අතර එමගින් රටේ අනාගතය සුරක්ෂිත කර ගත හැක

## 03.සේවා නියුක්තිය කෙරෙහි කෘෂි අංශයේ දායකත්වය

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳු ජනතාවගෙන් 90%ක් පමණ තවමත් කෘෂි ආර්ථිකය තුළ ජීවත්වේ.මේ නිසා කෘෂිකර්මය,සත්ව පාලනය ,ධීවර යන අංශයන්හි සේවා නියුක්ති ප්‍රමාණය ඉහළ මට්ටමක පවතී.සේවා නියුක්තිය උත්පාදනය කිරිමේ මූලාශ්‍රයක් ලෙස 1950 ගණන්වල සිට 1980 දක්වා තුළ කෘෂි අංශය ඉතා වැදගත් තැනක් ගෙන තිබුණි. 1953 නව විට කෘෂි අංශයේ සේවා නියුක්තිය 53% ක්වූ අතර එය 1963 දී 52.9% ක් හා 1971 දී 50.4% විය.

1997 ආර්ථික ලිහිල්කරණයත් සමඟ කෘෂි අංශයේ සේවා නියුක්තිය පහල වැටිමක් සිදු වි ඇත.1953 සිට 1996 කාලය තුල වැවිලි අංශයේ සේවා නියුක්තිය 29% සිට 20% දක්වා අඩු වී ඇතත් එය දළ දේශිය නිෂ්පාදිතය කෘෂි අංශයේ දායකත්වය පහත වැටුන තරම් ප්‍රමාණයට වඩා අඩු අගයකි.1980 පමණ වන විට 51%ක් පමණ වු එය 1995 වන විට 36% ක් දක්වාද මෑත කාලය වන විට 29% ක් දක්වාද වෙනස් වී ඇත. ආර්ථිකයේ සමස්ථ සේවා නියුක්තියට කෘෂි අංශයේ දායකත්වය හා එහි වෙනස් විම පහත ආකාරයට පෙන්වා දිය හැක.2016 වර්ෂයේ 27.1%කී.2017 වර්ෂය වන විට සේවා නියුක්තිය ක්‍රමික අඩුවිමක් දක්නට ලැබේ.එය 26.1%කී.

| වර්ෂය | සේවානියුක්තිය(%) |
|---|---|
| 1953 | 53.0 |
| 1963 | 52.9 |
| 1971 | 50.4 |
| 1982 | 51.2 |
| 1990 | 47.7 |
| 1995 | 36.8 |
| 2000 | 34.9 |
| 2005 | 32.8 |
| 2010 | 31.7 |
| 2013 | 29.6 |
| 2014 | 28.5 |
| 2015 | 28.7 |
| 2016 | 27.1 |
| 2017 | 26.1 |

( 01 වගු සටහන)

මූලාශ්‍රය(ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව)

(ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා)

කෘෂි අංශයේ සේවා නියුක්තියෙන් වැඩි ප්‍රමාණයක් ඌන සේවා නියුක්තිකයන් ලෙසට සැලකේ.ඉහත වගුවට අනුව ප්‍රතිශතයක් ලෙස කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය ක්‍රමයෙන් අඩුවීමක් දක්නට ලැබේ.හේතුව වන්නේ කෘෂි අංශයේ ශ්‍රමය එම අංශයෙන් පිටතට ඇදීයාමයි.කාර්මික හා සේවා අංශයන්හි ව්‍යාප්තියත් සමඟ කෘෂි සේවා නියුක්තියෙන් කොටසක් සේවා අංශයටත් කාර්මික අංශයේ ගොවිපළ නොවන ආදායම් මාර්ගවලට යොමු වීමයි. නමුත් ආදායම් උත්පාදනය මූලාශ්‍රයකට වඩා සේවා නියුක්ති උත්පාදන මූලාශ්‍රයකට වඩා සේවා නියුක්ති උත්පාදන මූලාශ්‍රයක් ලෙස කෘෂි අංශය වර්තමානයේදී වැදගත් තැනක් හිමි කර ගෙන ඇත.

- ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳු ජනතාවගෙන් 90%ක් පමණ තවමත් කෘෂි ආර්ථිකය තුළ ජීවත්වේ.මේ නිසා කෘෂිකර්මය,සත්ව පාලනය ,ධීවර යන අංශයන්හි සේවා නියුක්ති ප්‍රමාණය ඉහළ මට්ටමක පවතී.

- 1953 නව විට කෘෂි අංශයේ සේවා නියුක්තිය 53% ක්වූ අතර එය 1963 දී 52.9% ක් හා 1971 දී 50.4% විය.

- ආර්ථිකයේ සමස්ථ සේවා නියුක්තියට කෘෂි අංශයේ දායකත්වය හා එහි වෙනස් වීම පහත ආකාරයට පෙන්වා දිය හැක.2016 වර්ෂයේ 27.1%කි.2017 වර්ෂය වන විට සේවා නියුක්තිය ක්‍රමික අඩුවීමක් දක්නට ලැබේ.එය 26.1%කි.

ප්‍රධාන වෘත්තිය කාණ්ඩ අනුව කෘෂිකාර්මික අංශයේ ශ්‍රම ඉල්ලුම -2017

| වෘත්තිය කාණ්ඩය | කෘෂිකර්මාන්තය(%) |
|---|---|
| කළමණාකරුවන් | 0.9 |
| වෘත්තිකයන් | 0.0 |
| සේවා හා විකුණුම් සේවකයන් | 0.1 |
| ලිපිකරු සහාය සේවකයින් | 0.3 |
| පුහුණු කෘෂිකාර්මික,වන විද්‍යා සහ ධිවර | 16.8 |
| ශිල්පීය සහ ආශ්‍රිත කර්මාන්ත සේවකයන් | 0.6 |
| යන්ත්‍රාගාර සහ යන්ත්‍ර ක්‍රියාකරුවන් සහ එකලස්කරුවන් | 0.6 |
| ප්‍රාථමික රැකියාවන් | 73.3 |

(02 වගු සටහන)

මුලාශ්‍රය .(ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව)

(Labour Demand Survey-2017)

2017 වර්ෂයේ ප්‍රධාන වෘත්තිය කාණ්ඩ කෘෂිකාර්මික අංශයේ ශ්‍රම ඉල්ලුම ඉහතින් දැක්වේ.කෘෂි කර්මාන්තයේ ශ්‍රම ඉල්ලුම වැඩිම වෘත්තිය කාණ්ඩය වනුයේ ප්‍රාථමික රැකියාවන් සඳහාය.එය73.3% ක් වේ. කෘෂිකර්මාන්තයේ වෘත්තිකයන්ගේ වෘත්තිය කාණ්ඩය අඩු ඉල්ලුමක් ඇත. එය 0.0% වේ. සේවා හා විකුණුම් සේවකයන් 0.1% ලෙස දැක්වේ.

- කෘෂි කර්මාන්තයේ ශ්‍රම ඉල්ලුම වැඩිම වෘත්තිය කාණ්ඩය වනුයේ ප්‍රාථමික රැකියාවන් සඳහාය.එය73.3% ක් වේ. කෘෂිකර්මාන්තයේ වෘත්තිකයන්ගේ වෘත්තිය කාණ්ඩය අඩු ඉල්ලුමක් ඇත.එය 0.0 %වේ.සේවා හා විකුණුම් සේවකයන් 0.1% ලෙස දැක්වේ.

**නිගමන සහ යෝජනා**

නිදහසින් පසුව ශ්‍රී ලංකාවේ දළ දේශිය නිෂ්පාදිතය තුළ කෘෂිකාර්මික අංශයේ දායකත්වය සාපේක්ෂව පහත වැටී ඇත .නමුත් නිරපේක්ෂව කෘෂිකාර්මික නිෂ්පාදිතයන්ගේ වර්ධනයක් පවතී. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාවගෙන් වැඩි කොටසක් තවමත් කෘෂිකාර්මික අංශය තුළ කටයුතු කරන අතර මේ නිසා කෘෂී අංශයේ සේවා නියුක්තිය ඉහළ අගයක් ගනී. කාර්මික අපනයනවල මුළු අපනයන අගය ඉහළ අගයක් ගනු ලැබුවද ශුද්ධ අපනයන ආදායම තුළ කෘෂිකාර්මික නිෂ්පාදන මඟින් ලබා දෙන ආදායම් වටිනාකම ඉහළ අගයක් ගනී. ඉහත තත්ත්වයන් අනුව තවදුරටත් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය තුළ කෘෂිකාර්මික අංශය සතුව ඉහළ කාර්ය භාරයක් පවතින බව හදුනා ගත හැක.